# ප්‍රධාන කාරණා අන්තර්ගත ලේඛනය - භාරකාරත්වය, භාරකරු සහ ඇපකර සේවා

| නිෂ්පාදනය/ සේවය | දිරි දීමනා සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍ය සහ වෙනත් ප්‍රතිලාභ | ගාස්තු/ අයකිරීම, කොමිස් මුදල්, පොළිය | නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන නියම සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **NDB භාරකාරත්ව සේවා** | • වත්කම් - කොටස් සහ ස්ථාවර ආදායම් සුරකුම්පත් ආරක්ෂිතව තැබීම<br>• සුරකුම්පත් මිල දී ගැනීම් සඳහා මුදලින් ගෙවීම සහ සුරකුම්පත් විකුණුම් ප්‍රතිශ්ධා රැස් කිරීම - කොටස් සහ ස්ථාවර ආදායම් සුරකුම්පත්<br>• ආයතනික ක්‍රියාකාරකම් සඳහා සහාය වීම - කොටස් අයිතිවාසිකම්/ පාරිතෝෂික ගැටළු, IPO යනාදිය<br>• කාලීන ආයෝජන වාර්තා කිරීම | • **AUM රුපියල් බිලියන 3 කට වඩා අඩු නම්:-**<br>• තනි පුද්ගලයන් සඳහා වූ මාසික ස්ථාවර ගාස්තුව/ වෙනස් වන ගාස්තුව (සාකච්ඡා කළ හැකි වේ)<br>• ආයතන සඳහා වූ මාසික ස්ථාවර ගාස්තුව/ වෙනස් වන ගාස්තුව (සාකච්ඡා කළ හැකි වේ)<br>• **AUM රුපියල් මිලියන 3 කට වඩා වැඩි නම්:-**<br>• තනි පුද්ගලයන් සඳහා වූ මාසික ස්ථාවර ගාස්තුව/ වෙනස් වන ගාස්තුව (සාකච්ඡා කළ හැකි වේ)<br>• සංස්ථා සඳහා වූ මාසික ස්ථාවර ගාස්තුව/ වෙනස් වන ගාස්තුව (සාකච්ඡා කළ හැකි වේ)<br>(AUM සමග අදාළ රජයේ බදු මත පදනම්ව ගාස්තු සාකච්ඡා කළ හැකි වේ.) | **තනි පුද්ගලයන්:-**<br>• යථා පරිදි සහතික කරන ලද භාරකාරත්ව ගිවිසුම<br>• යථා පරිදි සම්පූර්ණ කර අත්සන් කරන ලද ගිණුම් විවෘත කිරීමේ ආකෘතිපත්‍ර (භාරකාරත්ව ජංගම ගිණුම, CSE CDS ගිණුම සහ CBSL CDS ගිණුම) සහ තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය වන උපකාරක ලේඛන<br>**සංස්ථා**<br>• යථා පරිදි සහතික කරන ලද භාරකාරත්ව ගිවිසුම<br>• අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයේ සහතික කළ උද්ධෘත සහ බලයලත් අත්සන්කරුවන්ගේ ලැයිස්තුව, අලුතින් පසුව යා කරනු ලබන සමාගම් ලේඛන<br>• යථා පරිදි සහතික කර අත්සන් කරන ලද ගිණුම් විවෘත කිරීමේ ආකෘතිපත්‍ර (භාරකාරත්ව ජංගම ගිණුම, CSE CDS ගිණුම සහ CBSL CDS ගිණුම) සහ තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන උපකාරක ලේඛන | **යෝග්‍ය ගණුදෙනුකරුවන්:**<br>• ණය බරින් තොර ඉහළ පංතියේ තැනැත්තන්<br>• සංස්ථා<br>• සමාජ, සමිති සහ පුණ්‍ය ආයතන<br>• මාර්ගගත ගෙවීම්, පිවිසුම් සමාගම් (E- භාරකරුවන්)<br>• විදේශීය තනි පුද්ගලන් සහ සංස්ථා<br>• අරමුදල් කළමනාකරණ සමාගම් සහ අරමුදල් කළමනාකරුවන් |

# ප්‍රධාන කාරණා අන්තර්ගත ලේඛනය - භාරකාරත්වය, භාරකරු සහ ඇපකර සේවා

| නිෂ්පාදනය/ සේවය | දිරි දීමනා සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍ය සහ වෙනත් ප්‍රතිලාභ | ගාස්තු/ අයකිරීම, කොමිස් මුදල්, පොළිය | නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන නියම සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **NDB භාරකාර සේවා** | • ආයෝජකයන්ගේ හොඳම සුභසිද්ධිය උදෙසා ක්‍රියාකරමින් සහ ආයෝජන ආරක්ෂාව සහතික කිරීම පිණිස නීති කෙටුම්පත්වල අන්තර්ගත වගන්ති සම්බන්ධයෙන් තහවුරු කිරීම<br>• ගණුදෙනුව වෙනුවෙන් භාර ගිණුමක් විවෘත කර පවත්වාගෙන යෑම/ කාලීනව කල් පිරීම සඳහා පහසුකම් සැලසීම<br>• ගණුදෙනු කාලසීමාව පුරාම හිලව් පිණිස තබනු ලබන සම්පාර්ශ්වීය ඇපකරය සම්බන්ධ භෞතික ආයෝජන කළමනාකරණය සහ පවත්වාගෙන යෑම<br>• හිලව් පිණිස තබන ලද සම්පාර්ශ්වීය ඇපකරය විශ්ලේෂණය කිරීම සහ ගණුදෙනු කාලය පුරාම ඇපකර ආවරණය පවත්වාගෙන යන බව සහතික කිරීම<br>• සම්පාර්ශ්වීය ඇපකර සම්බන්ධ විගණන ආරම්භ කිරීම සහ කල් අවසන්වීම් සිදු නොවී ඇති බවට තහවුරු කිරීම<br>• ඇපකර/ හවුල් ප්‍රකාශ නිකුත් කරන්නන් වෙත කාලීන ආකාරයකින් වූ ඉල්ලීම් පිළිබඳ සම්පූර්ණයෙන් නිරාකරණය කරන ලද ගිවිසුම් නිදහස් කිරීමෙහිලා පහසුකම් සැලසීම සහ ප්‍රතියෝජනා ලබා ගෙන ඇති බව සහතික කිරීම<br>• ඇපකරවල/ හවුල් ප්‍රකාශවල සිදු කරන ආයෝජන සම්බන්ධයෙන් වූ ශේෂය තහවුරු කිරීම් ලබා දීම<br>• ද්විතීය වෙළඳපල අලෙවිය සඳහා පහසුකම් සැලැස්වීම<br>• විද්‍යුත් තැපැල හරහා කල් පිරීමේ සංඥා ලබා දීම | • ඇපකර, හවුල් ප්‍රකාශ, නියෝජිත සේවා - සාකච්ඡා කළ හැකි ය.<br>• සෘණපත්‍ර - සාකච්ඡා කළ හැකි ය.<br>(රජයේ බදු අදාළ වේ) | • NDB ආයතනය භාරකරු/ නියෝජිත වශයෙන් පත් කරනු ලබන ක්‍රියාකාරකම පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කිරීම<br>• ගණුදෙනුව සම්බන්ධ සම්පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයක් (BR) ඉදිරිපත් කිරීම සහ බැංකු ගිණුමක් විවෘත කිරීම<br>• නෛතික තහවුරු කිරීම් සඳහා අදාළ උපලේඛන ද සමග අදාළ ආකාරයට නෛතික ලිපිලේඛන කෙටුම්පත්වල මෘදු පිටපත් හුවමාරු කිරීම<br>• ඇගයීම සඳහා ආයෝජන සහ නිසි උද්යෝගය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම | **යෝග්‍ය ගණුදෙනුකරුවන්:**<br>• ලියාපදිංචි මූල්‍ය සමාගම්<br>• සෘණපත්‍ර නිකුත් කිරීම<br>• සුදානම් කරන්නන්<br>• අරමුදල් කළමනාකරණ සමාගම් |

## ප්‍රධාන කාරණා අන්තර්ගත ලේඛනය - භාරකාරත්වය, භාරකරු සහ ඇපකර සේවා

| නිෂ්පාදනය/ සේවය | දිරි දීමනා සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍ය සහ වෙනත් ප්‍රතිලාභ | ගාස්තු/ අයකිරීම, කොමිස් මුදල්, පොළිය | නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන නියම සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **NDB එස්ක්‍රෝ සේවා** | • එකඟ වූ කොන්දේසි සපුරාලනු ලබන තෙක් වත්කම් දැරීම සඳහා මධ්‍යස්ථ සහ ආරක්ෂිත තුන්වන පාර්ශව යාන්ත්‍රණයක් සැපයීම<br>• ගිවිසුම්ගත වගකීම් සපුරාලනු ලැබීමෙන් පසුව පමණක් වත්කම් (අරමුදල්, ලේඛන, මෘදුකාංග, මූලාශ්‍ර සංකේත, යනාදිය) නිදහස් කරන බවට සහතික වීම මගින් ආරවුල් පිළිබඳ අවදානම් අඩු කිරීම<br>• ගණුදෙනුකාර පාර්ශව අතර විශ්වාසය සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම<br>• අදාළ අවස්ථාවල දී කාලීනව (උදා:- මාසිකව) වාර්තා කිරීමක් සහිතව ව්‍යුහගත අරමුදල් ප්‍රවාහ නියාමනයක් සඳහා පහසුකම් සැලසීම<br>• පුළුල් පරාසයක වූ ගණුදෙනු සඳහා සහාය වීම; එනම් -<br>– දේපළ වෙළඳාම්<br>– ඒකාබද්ධ කිරීම් සහ අත්කර ගැනීම් (M&A)<br>– මෘදුකාංග මූලාශ්‍ර සංකේත ඇපකර<br>– වෙනත් වාණිජ ගණුදෙනු | • දේපළ ඉඩකඩම් ඇපකර - සම්පූර්ණ ගණුදෙනු අගය මත හෝ වටිනාකමින් % මත පදනම් වූ මාසික ගාස්තුව (සාකච්ඡා කළ හැකි වේ)<br>• ඒකාබද්ධ කිරීම් සහ අත්කර ගැනීම් - ගණුදෙනුවේ ප්‍රමාණය මත හෝ වටිනාකමින් % මත පදනම් වූ එක්වරක් පමණක් ගෙවන ගාස්තුව (සාකච්ඡා කළ හැකි වේ)<br>• මෘදුකාංග එස්ක්‍රෝ - මාසික ස්ථාවර ගාස්තුව (සාකච්ඡා කළ හැකි වේ)<br>• වෙනත් ව්‍යාපාරික ගණුදෙනු- ගණුදෙනුවේ ස්වභාවය මත රඳා පවතින සාකච්ඡා කළ හැකි එක්වරක් පමණක් ගෙවන ගාස්තුව/ මාසික ස්ථාවර ගාස්තුව | • යථා පරිදි අත්සන් කරන ලද ඇප ගිවිසුම<br>• අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයේ සහතික කළඋද්ධෘත සහ බලයලත් අත්සන්කරුවන්ගේ ලැයිස්තුව<br>• යථා පරිදි අත්සන් කරන ලද ගිණුම් විවෘත කිරීමේ ඉල්ලුම්පත්‍රවල ආකෘති පත්‍ර (භාරකාරත්ව ගිණුම්) සහ තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය වන උපකාරක ලේඛන | • පුද්ගලයන්, සමාගම් සහ ආයතන<br>• දේපළ සංවර්ධනකරුවන් සහ තනි පුද්ගල දේපළ ගැණුම්කරුවන්<br>• ඒකාබද්ධ කිරීම්වල සහ අත්කර ගැනීම්වල යෙදී සිටින සමාගම් සහ තනි පුද්ගලයන්<br>• මෘදුකාංග සමාගම්, සංවර්ධනකරුවන් සහ බලපත්‍රලාභීන්<br>• ණය බරින් තොර ඉහළ පංතියේ තැනැත්තන්<br>• හවුල් ආයතන/ හවුල් ව්‍යාපාර<br>• වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සඳහා සහ කොන්දේසි සහිතව නිදහස් කිරීම සඳහා මධ්‍යස්ථ තුන්වන පාර්ශව භාරකරුවකු අවශ්‍ය වන යම් පාර්ශවයක් |

## පැමිණිලි ඉදිරිපත් කිරීමේ කාර්ය පටිපාටිය

පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා ගණුදෙනුකරුවන් වෙත පහත දැක්වෙන ක්‍රමවේද පවතියි; එනම්

- කළමනාකරු හරහා
- NDB ඇමතුම් මධ්‍යස්ථානය හරහා
- contact@ndbbank.com යන විද්‍යුත් ලිපිනය හරහා අප වෙත විද්‍යුත් තැපෑලෙන් යොමු කරන්න
- මෙම ලිපිනයට ලිඛිතව ඉදිරිපත් කරන්න:- කළමනාකරු, භාරකාරත්ව සහ භාරකාර සේවා අංශය, නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී, නො 40, නවම් මාවත, කොළඹ 02.

බැංකුවෙන් සෑහීමට පත් විය හැකි විසඳුමක් නොලැබුණහොත්, ගණුදෙනුකරු විසින් ස්වකීය පැමිණිල්ල ශ්‍රී ලංකාවේ මූල්‍ය ඔම්බුස්මන්වරයා වෙත ඉදිරිපත් කළ හැකි වේ.

**ආනන්ද කරුණාදාස මහතා,**
මූල්‍ය ඔම්බුඩ්ස්මන්,
මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය,
අංක 01,
බෙතෙස්ඩා පෙදෙස, මිලාගිරිය,
කොළඹ 05.
දුරකථන අංකය:-+94112595624
ටෙලිෆැක්ස්:- +94112595625
විද්‍යුත් තැපෑල:- fosril@sltnet.lk
වෙබ් අඩවිය:- www.financialombudsman.lk